දිවි අහිමි කරගැනීම් පැතිර යාම යනු සැබෑ තත්වයකි. විශේෂයෙන්ම ඇතැම් දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් ඔස්සේ පවා, දිවි අහිමි කරගැනීම් සඳහා වක්‍රාකාරයෙන් අනුබල ලැබීමක් සිදුවීමට හැකියාවක් තිබේ. එනිසාම, දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වන පුවත් වාර්තාවන්, ලිපි සමගින් උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය භාවිතාවකි. දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට එය ඉවහල් විය හැක.

පහත දැක්වෙන සිළුමිණ ලිපිය (11/08) සහ Medialk.com ලිපිය (11/07) සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමට ඔවුන් සැලකිලිමත් වී ඇත. මෙය මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වීමක් ලෙසින් මෙන්ම සිය මාධ්‍ය වගකීම මනාව අවබෝධ කරගැනීමක් ලෙසින්ද අපගේ ප්‍රශංසාවට ලක් විය යුතු වේ.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Silumina #MediaLKcom